**ශ්‍රී ලංකා කැරම් සම්මේලනය - 2018**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1. මතය ව්‍යාචනය

ශ්‍රී ලංකා කැරම් සම්මේලනයේ ("සම්මේලනයේ") 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ප්‍රකාශය, සමුච්චිත අරමුදල් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මෙම විගණනය සිදුකිරීම සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි යෙදෙන වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයක් විසින් මට සහාය වන ලදී.

සම්මේලනයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි. මෙම වාර්තාවේ 1.5 ඡේදයේ විස්තර කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

### 1.2 මතය ව්‍යාචනය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය ව්‍යාචනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ විගණන විෂය පථය යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන සුළු හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සම්මේලනයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සම්මේලනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සම්මේලනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සම්මේලනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සංගමයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

----------------------

මාගේ වගකීම වන්නේ ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව සම්මේලනයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණනයක් සිදුකර වාර්තාවක් නිකුත් කිරීමයි. කෙසේවෙතත්, මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවල බලපෑම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ඉදිරිපත් කිරීම සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

--------------------------------------------------------------------------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

------------------------------------------------------------------

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම් | නිර්දේශ |
|---|---|---|
| රු. 2,191,030ක් වටිනා දේපල, පිරියත සහ උපකරණ සඳහා භෞතික සත්‍යාපනයක් සිදු කර නොතිබූණු අතර ස්ථාවර වත්කම් ලේඛනය පවත්වාගෙන ගොස් නොතිබුණි. එබැවින් වත්කම්වල නිරවද්‍යතාවය සහ පැවැත්ම සතුටුදායක ලෙස පරීක්ෂා කළ නොහැක. | සම්මේලනයේ අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | ජංගම නොවන වත්කම් සත්‍යාපනය කිරීම සඳහා විගණනය වෙත ලේඛන ප්‍රමාණවත් පරිදි ඉදිරිපත් කළ යුතුය. |

### 1.5.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

--------------------------------------------

| විගණන නිරීක්ෂණ | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකරණයේ අදහස් දැක්වීම් | නිර්දේශ |
|---|---|---|---|---|
| මුදල් සහ බැංකු ශේෂය | 54,532 | අත්තිකාරම් ගෙවීම සහ චලනය නොවන මුදල් සහ බැංකු ශේෂ සම්බන්ධ ස්වාධීන තහවුරු කිරීම් සහ තෙවන පාර්ශවීය තහවුරු කිරීම. | සම්මේලනයේ අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් සහ බැංකු ශේෂයේ පැවැත්ම තහවුරු කර ගැනීම සඳහා විගණනය වෙත ලේඛන ප්‍රමාණවත් පරිදි ඉදිරිපත් කළ යුතුය. |

**1.5.3 ගිණුම්කරණ අඩුපාඩු**

---------------------------

| **විගණන නිරීක්ෂණ** | **කළමනාකරණයේ අදහස් දැක්වීම්** | **නිර්දේශ** |
| --- | --- | --- |
| මුදල් පොතට අනුව බැංකු ශේෂය රු. 848,241ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ඊට අනුරූපී වටිනාකම රු. 294,941ක් විය. බැංකු ශේෂය සහ මුදල් පොතේ ශේෂය අතර රු. 553,300ක වෙනසක් නිරීක්ෂණය විය. | සම්මේලනයේ අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව සකස් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

-----------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 1,014,914ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලයක් රු. 301,027ක ඌනතාවයක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 713,887ක පිරිහීමක් නිරීක්ෂණය විය. මුළු වියදම රු. 2,796,398කින් වැඩිවීම මෙම පිරිහීමට හේතුවිය.